සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2003 වර්ෂයේ ජූලි-සැප්තැම්බර් කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,541 - 2008 මාර්තු මස 14 වැනි සිකුරාදා - 2008.03.14**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 264 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 264 |


*සැ. යු.-* පරිසර සංරක්ෂණ බදු පනත් කෙටුම්පත 2008 ජනවාරි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ගෝසාතක ආඥා පනත (සංශෝධන) පනත් කෙටුම්පත 2008 ජනවාරි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2005 ජනවාරි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 මාර්තු මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 මාර්තු මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබූවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ භාෂාවෙන් උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපලක් ද, හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 අප්‍රේල් මස 11 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 පෙබරවාරි මස 26 දින,
කොළඹ 11,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | කඩවත්සතර | ගාල්ල මහ මෝදර රජයේ මහ රෝහල් කොට්ඨාසය උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල. |
| -එම- | -එම- | ගාල්ල කරාපිටිය රෝහල් කොට්ඨාසය උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | -එම- |

03-403

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීම - 2008**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* .– 2008 මැයි මාසයේදී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවරදී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* .– රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද මෙහි පහත සඳහන් කොන්දේසි වලටද යටත්ව පර්යේෂණ සහකාර සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වෙයි.

(ii) විවෘත බඳවා ගැනීම් යටතේ පත්කරනු ලබන නිලධාරීන් වසර 03ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත්කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iii) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 5ක් තුළ ලබාගත යුතුය.

(iv) පත්වීම ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලටද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලටද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ නියෝගවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය*.– MT 2-2006A - පර්යේෂණ සහකාර සේවය II 'අ' ශ්‍රේණිය - රු. 14,570-10 x170-11x180-6 x 240-14 x 320-රු.24,170 (රා. ප. ච. 06/2006 (IV) අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 14,570-10 x 170-රු. 16,270/- වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ.

II 'ආ' ශ්‍රේණියේ නිලධාරීන් තුන්වෙනි වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :-

(i) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(iii) මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

06. *අධ්‍යාපන සුදුසුකම්* :-

ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලයක ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

සහ

භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථය සහිතව විෂයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම ; හෝ ඒ හා සමාන විභාගයකින් සමත්වීම.

*සටහන*.-ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් ඩිප්ලෝමාවක් ලබාගත් අය එම විශ්ව විද්‍යාලයේ එම ඩිප්ලෝමාවට අදාල පදනම් පාඨමාලාව සමත්වී ඇත්නම් අ.පො.ස. (සා.පෙළ) සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැක.

07. *බඳවාගැනීමේ ක්‍රමය* :-

(i) මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොදු තරග විභාගයට පෙනී සිටිය යුතුය.

(ii) පොදු තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේදී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

08. *විභාගය* :-

(i) මෙම විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.

(iii) ඉල්ලීම කරන ලද භාෂා මාධ්‍යය විභාගයේදී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) විභාග ගාස්තුව රු. 300කි.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.

(v) *විභාග විෂයන්*.- විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(i) බුද්ධි පරීක්ෂණය ;
(ii) තාක්ෂණික ප්‍රශ්න පත්‍රය ;

(vi) විෂය නිර්දේශය :-

(අ) *බුද්ධි පරීක්ෂණය* :- කාලය පැය 01 යි. මුළු ලකුණු 100යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ආ) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය*:- කාලය පැය 01 යි. මුළු ලකුණු 100යි.

පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි ෴-

(i) රසායනාගාර උපකරණ හඳුනා ගැනීම හා නඩත්තුව
(ii) රෝග විනිශ්චය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම
 ව්‍යාධි වේද
 පරපෝෂිත වේද
 ක්ෂුද්‍ර ජීවී වේද
 මස්තු වේද
 පෝෂණ
(iii) සත්ව පාලනය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම
 භෞතික පරීක්ෂණ
 රසායනික පරීක්ෂණ
 සංවේදතා පරීක්ෂණ
(iv) රසායනාගාර පවිත්‍රතාව, විෂබීජහරණය
(v) සාම්පල ලබාගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය

09. *ඉල්ලුම්කිරීමේ ක්‍රමය* :-

(i) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතුය. 8 1/2 x 12 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2008.04.10 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ 'පර්යේෂණ සහකාර' තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන*.- රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

(i) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම ;
(ii) ලිපිනය ;
(iii) ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය ;
ii. අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික.

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය*:- විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේදී තමාගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛණ පිළිගැනේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය (විභාග දිනට අවුරුදු 3ක ට කලින් නිකුත් කරන ලද)

*සාවද්‍ය තොරතුරු සැපයීම* :- මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ, විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගිය හොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (II)(අ) ඡේදයේ ආරම්භයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත්කිරීමට අදාල වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතුවුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගතයුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

එච්. එම්. එස්. පී. හේරත්,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,

2008 පෙබරවාරි මස 05 වැනි දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

ආදර්ශ අයදුම්පත් ආකෘතිය

**පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

*ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධාරි තනතුර සඳහා අයදුම්පත*

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

අදාල අංකය කොටුව තුල ලියන්න

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාල කොටුව තුල ලියන්න)

01. නම :-

1:1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා : .......................... SILVA, B. A.
1:2 සම්පූර්ණ නම සිංහලෙන් :——————.
1:3 ජාතික හැඳුනුම්පත් අංකය :

02. ලිපිනය :-

2:1 පෞද්ගලික ලිපිනය :——————.
2:2 රාජකාරි ලිපිනය :——————.
2:3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :——————.

03. ස්ත්‍රී පුරුෂ භාවය (අදාළ කොටුව තුළ සලකුණු කරන්න.)

3:1 ස්ත්‍රී
පුරුෂ
3:2 උපන් දිනය :
වර්ෂය මාසය දිනය

3:3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :
අවුරුදු මාස දින

3:4 විවාහක අවිවාහක බව (අදාල අංකය කොටුව තුල සලකුණු කරන්න)
විවාහක
අවිවාහක

04. අධ්‍යාපන සුදුසුකම් :

4:1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
වර්ෂය:—————— මාසය:——————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4:2 (අ) සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් ආයතනය :————.

(ආ) සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කළින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්)

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම:——————.

මුදල් ඇණවුම් අංකය:——————.

| |
|---|
| සම්පූර්ණ විභාග ගාස්තුව රු. 300කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට.<br>ගෙවන කාර්යාලය : පේරාදෙණිය<br>කුවිතාන්සිය මෙහි අලවන්න. |

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරැදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාල වේ.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

නිලධාරියා විසින් ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුයි)

පදවි නාමය :——————.
ලිපිනය :——————.
දිනය:——————.

03-297

---

**පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

***ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගැනීම - 2008***

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* .— 2008 මැයි මාසයේදී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* .— රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව පශු සම්පත් සංවර්ධන නිලධාරි II පන්තියේ "ආ" ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් විය යුතුයි.

(ii) බඳවා ගනු ලබන නිලධාරීන් වසර 03ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. පත්කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iii) ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට ඇතුළුවූ නිලධාරීන් තනතුර ස්ථිර කිරීමේ දී වෙනත් කරුණුවලට අමතරව පරිවාස කාලය තුල රාජ්‍ය භාෂාව ත් එනම්, සිංහල හෝ දෙමළ භාෂාවේ ප්‍රවීණතාවය ලබාගත යුතුය. රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ වලින් නිදහස් කරවා ගැනීම සඳහා අ.පො.ස. (සා.පෙ.) විභාගයේ සිංහල/දෙමළ විෂයයන් සමත් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද විෂය ප්‍රතිඵල සටහනේ සහිතක කළ පිටපතක් හෝ විභාග සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.

(iv) පත්වීම ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ නියෝගවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :- MT– 2-2006A
රු. 14,570-10 x170-11 x 180-6 x 240-14 x 320- රු.24,170 (රාප.ච. 06/2006 (IV)අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 14,570-10 x 170- රු. 16,270 වැටුප් පියවරයන් මෙම තනතුරට අදාළ වේ.

II "ආ" පන්තියේ නිලධාරීන් IV වැටුප් පියවරට එළඹීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :-

(i) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලනොපායි.

(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(iii) මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

06. *අධ්‍යාපන සුදුසුකම්* .— 2008.04.10 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, කෘෂිකර්මය යන විෂයයන් දෙකක් සහිතව විෂයයන් 3කින් සමත්වීම.

සහ

වැලිසර, අනුරාධපුරය, කුණ්ඩසාලේ සත්ව පාලන විද්‍යාලවලින් ලබාගත් දෑ අවුරුදු ඩිප්ලෝමා සහිතකය.

*සටහන* .— ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර පූර්ව සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් වලංගු නොවේ.

07. *බඳවාගැනීමේ ක්‍රමය* .— මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොදු තරඟ විභාගයට පෙනී සිටිය යුතුය.

(i) පොදු තරඟ විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 50%ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

08. *විභාගය* :-

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(iii) ඉල්ලීම කරන ලද භාෂා මාධ්‍යය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iv) විභාග ගාස්තුව රු. 300කි.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.
(v) *විභාග විෂයන්* ඃ විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේඃ

(i) බුද්ධි පරීක්ෂණය
(ii) තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.

(vi) විෂය නිර්දේශය :-

(අ) *බුද්ධි පරීක්ෂණය* :- කාලය පැය 01 යි මුළු ලකුණු 100යි අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ආ) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය*:- කාලය පැය 01 යි. මුළු ලකුණු 100යි.

පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි ඃ

(i) ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා සත්ව පාලන කටයුතු පිළිබඳ පවත්නා සම්පත්, විභවයන් වර්තමාන තත්ත්වයන් හා ආර්ථිකයට ඇති දායකත්වය ;

(ii) ශ්‍රී ලංකාවේ සත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවිකරණ ක්‍රම ශ්‍රී ලංකාවේ පවතින සත්ව පාලන ගොවිපල රටා, ඒවායේ පිහිටීම හා විසිරීම ;

(iii) ගොවිපල සතුන් අභිජනනය සඳහා බහුලව යොදාගන්නා ක්‍රම ;

(iv) බෝවෙන සත්ව රෝග, සත්වරෝග මර්ධන ක්‍රියා පිළිවෙත් රෝගී සතුන්ගේ නියැදි රැස්කිරීම හා ප්‍රවාහනය ;

(v) ඒකාබද්ධ ගොවිපල් ක්‍රම හා ප්‍රතිචක්‍රියකරණ ක්‍රම ;

(vi) සත්ව පාලන හා ආශ්‍රිතව කර්මාන්ත කිරි සැකසීම, මස් සැකසීම, සත්ව ආහාර නිෂ්පාදනය ;

(vii) සත්ව නිෂ්පාදන ක්‍රියාවලියට අදාල ආදායම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල් වාර්තාකරණය හා ගිණුම් විශ්ලේෂණය සත්ව ගොවිපල් සැලසුම්කරණය ;

(viii) විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණ ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදායිතාවයත්.

09. *ඉල්ලුම්කිරීමේ ක්‍රමය* :-

(i) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 81/2" x 12" (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2008.04.10 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* .— රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය ඃ

(i) අපේක්ෂකයන්ගේ සම්පූර්ණ නම ;

(ii) ලිපිනය ;

(iii) ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය ;

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය:

(i) උප්පැන්න සහතිකය;

(ii) අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික.

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය* .— විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ ;

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය ;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය ;

*සාවද්‍ය තොරතුරු සැපයීම*:- මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ, විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (අ)II ඡේදයේ ආරම්භයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත්කිරීමට අදාල වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතුවුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මඟින් බඳවා ගතයුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ. (පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවාව පිළිබඳ සම්පූර්ණ විස්තර 2005.09.14 දිනැති අංක 1410/23 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ දක්වා ඇත.).

එච්. එම්. එස්. පී. හේරත්,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ- පේරාදෙණිය.

2008 පෙබරවාරි මස 05 වැනි දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ.
පේරාදෙණිය.

**ආදර්ශ අයදුම්පත් ආකෘතිය**

**පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

*ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුර සඳහා අයදුම්පත*

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

අදාළ අංකය කොටුව තුළ ලියන්න ඃ

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ කොටුව තුළ ලියන්න)

01. නම :-

1:1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

උදා : :——————. SILVA, B. A.

1:2 සම්පූර්ණ නම සිංහලෙන් :——————.

1:3 ජාතික හැඳුනුම්පත් අංකය :

02. ලිපිනය :-

2:1 පෞද්ගලික :——————.

2:2 රාජකාරි ලිපිනය :——————.

2:3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :——————.

03. ස්ත්‍රී පුරුෂ භාවය (අදාල කොටුව තුළ සලකුණු කරන්න)

3:1 ස්ත්‍රී
පුරුෂ

3:2 උපන් දිනය :
වර්ෂය මාසය දිනය

3:3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස ඃ
අවුරුදු මාස දින

3:4 විවාහක අවිවාහක බව (අදාල අංකය කොටුව තුල සලකුණු කරන්න)

විවාහක
අවිවාහක

04. *අධ්‍යාපන සුදුසුකම්* :

4:1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
වර්ෂය:—————— මාසය:——————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4:2 (අ) සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් ආයතනය :————.

(ආ) සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්) ඃ

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම:——————.

මුදල් ඇණවුම් අංකය:——————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 300කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට.
ගෙවන කාර්යාලය ඃ පේරාදෙණිය

කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරැදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

නිලධාරියා විසින් ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුයි)

පදවි නාමය :——————.
ලිපිනය :——————.
දිනය:——————.

03-298

---

**නොතාරිස් අවසාන විභාගය - 2007 සැප්තැම්බර්**

මෙහි පහත අයදුම්කරුවන් ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් දක්වා ඇති භාෂාවෙන් නොතාරිස්වරුන් වශයෙන් කටයුතු කිරීම සඳහා නොතාරිස් අවසාන විභාගය සමත් වී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 01. | එස්. එම්. දාවිත් සිංඤෝ මයා | සිංහල |
| 02. | ඒ. එන්. චන්ද්‍රාදිත්‍ය මයා | සිංහල |
| 03. | එච්. එම්. එස්. ඩී. හේරත් මයා | සිංහල |
| 04. | එල්. ඩබ්. එස්. දයාරත්න මයා | සිංහල |
| 05. | එච්. ජී. විජයානන්ද මයා | සිංහල |
| 06. | ඩබ්. එම්. රූපසිංහ මයා | සිංහල |
| 07. | පී. එම්. ඕලුනී කුරේ මිය | සිංහල |
| 08. | අයි. බී. විමලවංශසූර්ය මයා | සිංහල |
| 09. | සී. කේ. ගමගේ මයා | සිංහල |
| 10. | ජී. කේ. ගමගේ මිය | සිංහල |
| 11. | එච්. එල්. එම්. ජවුෆර් මයා | දෙමළ |
| 12. | ඒ. එස්.අයියර් මයා | දෙමළ |
| 13. | ජේ. ඩී. සී. ජේ. එස්. නානායක්කාර මයා | සිංහල |
| 14. | ඩී. එම්. පී. සුජාතා මිය | සිංහල |
| 15. | වයි. ජී. සෙනෙවිරත්න මයා | සිංහල |
| 16. | ඊ. එම්. ඒ. කේ. කුමාරතුංග මිය | සිංහල |
| 17. | ඒ. එම්. ගුණසේන මයා | සිංහල |
| 18. | ඩී. ඒ. එල්. ඩබ්. රණසිංහ මයා | සිංහල |
| 19. | එල්. ඒ. වංශවතී මිය | සිංහල |
| 20. | එස්. පී. ඩී. එච්. කේ. පතිරණ මිය | සිංහල |
| 21. | ඒ. එම්. ටී. අබේකෝන් මයා | සිංහල |
| 22. | ඒ. සී. එම්. ෆලීල් මයා | දෙමළ |
| 23. | කේ. ආර්. ජයතිලක මයා | සිංහල |
| 24. | එම්. උදයකුමාරන් මයා | දෙමළ |
| 25. | කේ. ත්‍යාගරාජා මයා | දෙමළ |
| 26. | වී. සිවසුබ්‍රමනියම් මයා | දෙමළ |
| 27. | ඩී. නිශ්ශංක මයා | සිංහල |
| 28. | ඩී. එස්. ශ්‍රියාසිංහ මයා | සිංහල |
| 29. | එච්. ජේ. දයාරත්න මයා | සිංහල |
| 30. | එච්. එල්. ඒ. ඩී. බී. ඩී. සෙනෙවිරත්න මිය | සිංහල |
| 31. | එච්. ටී. දයානන්ද මයා | සිංහල |
| 32. | කේ. තිරුචෙල්වම් මයා | දෙමළ |
| 33. | එච්. එම්. එච්. එච්. වික්‍රමසිංහ මයා | සිංහල |
| 34. | එච්. ඩී. එච්. එල්. කරුණාරත්න මිය | සිංහල |
| 35. | ඒ. කේ. ඩී. අල්විස් මිය | සිංහල |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 පෙබරවාරි මස, 27 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11.

03-402

---

**කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ III ශ්‍රේණියේ කෘෂිකර්ම උපදේශක පර්යේෂණ සහකාර, ගොවිපල් යාන්ත්‍රික උපදේශක, ඉංජිනේරු සහායක, ඉංජිනේරු ෆෝමන්, කාර්මික නිලධාරි සහ ගොඩනැගිලි ඕවසියර්/වැඩ පරීක්ෂක තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2008**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

03. මෙම තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) අනුව මාසික වැටුප් පරිමාණය රු. 14,570-170x10-180x11-240-6-320-14- රු. 24,170ක් හිමි වේ.

04. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුවන් පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය.

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|
| | *අ.පො.ස. (සා.පෙ)* | *අ.පො.ස. (උ.පෙ)* | |
| කෘෂිකර්ම උපදේශක හා පර්යේෂණ සහකාර | භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (6) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම | සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විද්‍යා විෂයයන් දෙකක් සමඟ විද්‍යා විෂයයන් 03කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (පැරණි නිර්දේශය) එකවර සමත් වීම<br>*හෝ*<br>ජීව විද්‍යාව, රසායන විද්‍යාව යන විද්‍යා විෂයයන් දෙකක් සමග විද්‍යා විෂයයන් 03කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (නව නිර්දේශය) එකවර සමත්වීම | කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොල, වවුනියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම<br>*හෝ*<br>දඹුල්ල හා කුලියාපිටිය කාර්මික විද්‍යාලවලින් ලබාගත් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම<br>*හෝ*<br>ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම<br>හෝ<br>රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම<br>*හෝ*<br>ඉහත සුදුසුකම්වලට සමානයයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ලබා තිබීම |
| ගොවිපල් යාන්ත්‍රික උපදේශක<br>ඉංජිනේරු සහායක<br>ඉංජිනේරු ෆෝමන්<br>කාර්මික නිලධාරි | භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (6) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම | ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විද්‍යා විෂයයන් දෙකක් සමඟ විද්‍යා විෂයයන් 03 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (පැරණි නිර්දේශය) එකවර සමත්වීම<br>*හෝ*<br>සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විද්‍යා විෂයයන් දෙකක් සමඟ විද්‍යා විෂයයන් 03කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (නව නිර්දේශය) එකවර සමත්වීම | (i) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව<br>*හෝ*<br>(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව<br>*හෝ*<br>(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව<br>*හෝ*<br>(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණ ඩිප්ලෝමාව<br>*හෝ*<br>(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම |

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* *අ.පො.ස. (සා.පෙ)* | *අ.පො.ස. (උ.පෙ)* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|
| | | | *හෝ* (vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම |
| ගොඩනැගිලි ඕවසියර්/ වැඩ පරීක්ෂක | භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (6) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම. | ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විද්‍යා විෂයයන් දෙකක් සමඟ විද්‍යා විෂයයන් 03කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (පැරණි නිර්දේශය) එකවර සමත්වීම හෝ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විද්‍යා විෂයයන් දෙකක් සමඟ විද්‍යා විෂයයන් 03කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (නව නිර්දේශය) එකවර සමත්වීම | (i) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව *හෝ* (ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව *හෝ* (iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව *හෝ* (iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණ ඩිප්ලෝමාව *හෝ* (v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම *හෝ* (vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

06. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(*අ*) මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 (21cm x 29cm) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් 1 සිට 4 දක්වා ඡේද මුල් පිටුවට ද ඇතුළත් වන පරිදි අයදුම්පත් පිළියෙල කළ යුතුය.

(*ආ*) අයදුම්පත් සම්පූර්ණ කළ යුත්තේ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

(*ඇ*) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2008.04.15 දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ඈ) අයදුම්පත් බහාලන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඉ) විභාග ගාස්තුව එක් තනතුරක් සඳහා රුපියල් 250කි. එම විභාග ගාස්තු දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගත් මුදල් කුවිතාන්සිය අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඊ) 2006.12.15 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ගොවිපල් යාන්ත්‍රික උපදේශක, ඉංජිනේරු සහායක සහ පර්යේෂණ සහකාර තනතුරු සඳහා ද 2007.02.09 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ගොඩනැගිලි ඕවසියර්/වැඩ පරීක්ෂක තනතුර සඳහා ද, අයදුම්පත් ඉදිරිපත් කළ අයවලුන් මෙම නිවේදනය පරිදි නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එම තනතුර සඳහා නැවත විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවන අතර අයදුම්පතේ නියමිත ස්ථානයේ කලින් මුදල් ගෙවූ කුවිතාන්සි අංකය, දිනය හා ගෙවූ තැපැල් කාර්යාලය සඳහන් කල යුතුය.

(උ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඌ) රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චයකාරවරයෙකු හෝ නීතිඥයකු හෝ රජයේ සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු විසින් අයදුම්පත්‍රයේ අපේක්ෂක/අපේක්ෂිකාවගේ අත්සන සහතික කළ යුතුය.

(එ) දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් තම ආයතන ප්‍රධානිය මඟින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. *විභාග පරිපාටිය* :

(අ) ප්‍රවේශ පත්‍ර අයදුම්පත්‍ර එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) මෙම විභාග මැයි මාසයේ දී පමණ පවත්වනු ඇත. විභාග දිනට දින 7කට කලින් ප්‍රවේශ පත්‍ර නොලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් පහත සඳහන් විස්තර නොපමාව බත්තරමුල්ල, පැලවත්ත විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත දන්වමින් ප්‍රවේශ පත්‍ර ඉල්ලුම් කළ යුතුය :

(i) විභාගයේ නම

(ii) අපේක්ෂක/අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම

(iii) ලිපිනය

(iv) ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි කළ දිනය, ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය හා අංකය

(v) විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය

(ඇ) විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුව ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඈ) අනන්‍යතාව: තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තමා අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා

i පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය පිළිගැනේ.

(ඉ) විෂයය නිර්දේශය :

(i) බුද්ධි පරීක්ෂණය (කාලය පැය 1යි. මුළු ලකුණු 100)
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ වාස්තවික ප්‍රශ්නවලින් යුක්තය.

(ii) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය (කාලය පැය 2යි. මුළු ලකුණු 100යි)

i වන කොටසට වාස්තවික ප්‍රශ්න පත්‍රය කාලය පැය 1යි.
ii වන කොටස ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රය පැය 1යි.

| *තනතුර* | *තාක්ෂණ ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය* |
|---|---|
| කෘෂිකර්ම උපදේශක හා පර්යේෂණ සහකාර | ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මයේ දායකත්වය/ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම/පස හා ශාක පෝෂණය/ වී නිෂ්පාදනය/ වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය/ එළවළු නිෂ්පාදනය/ පළතුරු/භෝග ආරක්ෂණය/ පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම/වාරිමාර්ග ක්‍රම හා ජල කළමණාකරණය/ගොවිපල් යාන්ත්‍රීකරණය/මී මැසි පාලනය/මල් වගාව හා භූමි අලංකරණය/ආරක්ෂිත භෝග වගාවන්/සත්ව පාලනය/කෘෂිකාර්මික ව්‍යාප්තිය යන ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම සඳහා සැකසූ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |
| ගොවිපල් යාන්ත්‍රික උපදේශක<br>ඉංජිනේරු සහායක<br>ඉංජිනේරු ෆෝමන් | පැස්සුම්, කම්මල් වැඩ, වඩු වැඩ, වැඩපල යන්ත්‍ර, තහඩු වැඩ, කැපුම් තල, උපකරණ, ද්‍රව්‍ය ගුණ හා සරල ගණනය කිරීම, මෝටර් යාන්ත්‍රික විද්‍යාව, විදුලි ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම සඳහා සැකසූ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |
| කාර්මික නිලධාරි | විවිධ පැස්සුම් ක්‍රම හා ඒවා සඳහා යොදා ගන්නා උපකරණ හා මෙවලම්, උපකරණවල සීරු මාරු කිරීම, පැස්සුම් සඳහා වැඩ කොටස් පිළියෙල කිරීම<br><br>කම්මල් වැඩවලදී යොදාගන්නා උපකරණ, ලෝහ වර්ග හඳුනා ගැනීම විවිධ හැඩයන් සකස් කර ගැනීම වැඩ පලක ඇති විවිධ වර්ගවල යන්ත්‍ර හඳුනා ගැනීම ඒවායේ නිවැරදි ක්‍රියාකාරිත්වය හා නඩත්තුව<br><br>ද්‍රව්‍යවල විවිධ ද්‍රව්‍යන් හඳුනා ගැනීම, ද්‍රව්‍යමත බල ක්‍රියා කිරීමේ දී හැසිරීම් පරිමාව, බලය, බල සූර්ණය, කාර්යය, කාර්යක්ෂමතාව වැනි සරල ගණනය කිරීම් වැඩපළක තිබිය යුතු ආරක්ෂිත ක්‍රම |
| ගොඩනැගිලි ඕවසියර්/වැඩ පරීක්ෂක | (මැනීම සහ මට්ටම් ගැනීම, ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි ඉදිකිරීම සහ ඇස්තමේන්තු පිළියෙල කිරීම, ව්‍යූහ නම්‍යතා යුක්ත ව්‍යාපෘතිවල බල සටහන,<br>සේවාවන් : විදුලිය, ජලය, සනීපාරක්ෂක යන ක්ෂේත්‍රයන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීමට සැකසූ ප්‍රශ්න පත්‍රයකි. |

(ඊ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර විභාගයට පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය.

(උ) පර්යේෂණ සහකාර, ඉංජිනේරු සහායක, ඉංජිනේරු ෆෝමන්, කාර්මික නිලධාරි, ගොවිපල් යාන්ත්‍රික උපදේශක හා ගොඩනැගිලි ඕවසියර්/වැඩ පරීක්ෂක යන තනතුරුවලට බඳවා ගැනීමේ තරග විභාග කොළඹදී පමණක් පැවැත්වේ.

(ඌ) කෘෂිකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය පහත සඳහන් මධ්‍යස්ථානවලදී පැවැත්වෙනු ඇත.

| *විභාග මධ්‍යස්ථානය* | *සංකේත අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| ත්‍රිකුණාමලය | 04 |
| කුරුණෑගල | 05 |
| අනුරාධපුරය | 06 |
| බදුල්ල | 07 |
| රත්නපුරය | 08 |

(එ) යම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අපේක්ෂක සංඛ්‍යාවක් ඉදිරිපත් නොවුවහොත් එම විභාග මධ්‍යස්ථානය අවලංගු කිරීමට සිදුවන බැවින් තම මනාපය පරිදි විභාග මධ්‍යස්ථාන 03ක් සඳහන් කළ යුතුය.

*සටහන.*-එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු එකතු කිරීමෙන් සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය මත බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

08. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. තෝරා ගනු ලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද, සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

ii. කෘෂිකර්ම උපදේශක තනතුරේ දිවයින පුරා පවතින සියලු පුරප්පාඩු මෙම විභාගයේ ප්‍රථිපල මත පිරවීමට කටයුතු කරනු ලබන අතර පහත සඳහන් දිස්ත්‍රික්කවල හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.

| *පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක හා කොට්ඨාශ* | *සංකේත අංකය* |
|---|---|
| මහනුවර (මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) | 01 |
| පොළොන්නරුව | 02 |
| අනුරාධපුරය | 03 |
| හම්බන්තොට (වීරවිල කොට්ඨාශය) | 04 |
| මොණරාගල | 05 |
| නුවරඑළිය | 06 |
| වවුනියාව | 07 |
| කිළිනොච්චිය | 08 |
| අම්පාර | 09 |
| මාතලේ (විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) | 10 |
| බදුල්ල (කන්දකැටිය/මහියංගනය රිදී මාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) | 11 |
| ත්‍රිකුණාමලය (කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) | 12 |
| මන්නාරම (මුරුක්කන්/නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) | 13 |
| මොණරාගල (මුතුකණ්ඩිය කොට්ඨාශය) | 14 |

iii. ඉහත සේවා ස්ථාන ද ඇතුළත්ව තමන් සේවය කිරීමට කැමති සේවා ස්ථාන 05ක් තම මනාපය පරිදි අයදුම්පතේ 07 ඡේදයේ පැහැදිළිව සඳහන් කළ යුතුය. තනතුරට පත් කිරීමේ දී අයදුම්කරුවන් මනාපය පළකල සේවා ස්ථාන ලබාදීම ගැන අවධානය යොමු කරනු ලැබේ.

09. *බඳවා ගැනීමේ ක්‍රමය.*- සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 07 ඡේදයේ සඳහන් විභාගයට පෙනී සිට ඉන් උපරිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව 1:5 අනුපාතයට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් සහිත උපරිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

11. *ගැසට්* නිවේදනයේ සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ.

*සැලකිය යුතුයි.*- 2006.12.15 හා 2007.02.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍ර*වල පළ කරන ලද දැන්වීම අනුව ඉංජිනේරු සහායක, පර්යේෂණ සහකාර, ගොවිපල් යාන්ත්‍රික උපදේශක හා ගොඩනැගිලි ඔවසියර්/වැඩ පරීක්ෂක යන තනතුරු සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කළ අයදුම්කරුවන් මෙම නිවේදනයේ ප්‍රකාරව අදාළ තනතුරු සඳහා සුදුසුකම් තිබේ නම් ඉහත 6 ඡේදයේ (ඊ) වගන්තියේ ප්‍රකාරව කටයුතු කළ යුතුය. එම ගැසට් නිවේදන අනුව අයදුම්පත් ඉදිරිපත් කළ ද අදාළ තනතුරු සඳහා මෙම නිවේදනයේ ප්‍රකාර සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු ඔවුන් වෙත ආපසු ගෙවීමට විභාග කොමසාරිස් විසින් කටයුතු කරනු ඇත.

ආචාර්ය සී. කුඩාගමගේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම් පත්‍රය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම්පත**

Application for Open Competitive Examination for Recruitment to vacancies in the Sri Lanka Technological Service in the Department of Agriculture

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය: සිංහල 2
දෙමළ 3 අදාළ අංකය කොටුව තුළ ලියන්න
ඉංග්‍රීසි 4

ඉල්ලුම් කරන තනතුර:

| ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය | සංකේත අංකය |
|---|---|
| | |
| | |
| | |

01. නම:

1.1 මුලකුරු සමඟ නම:————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: SILVA, A. B.

1.2 සම්පූර්ණ නම:————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය:

02. ස්ථිර ලිපිනය:————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය:————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ස්ත්‍රී/පුරුෂ භාවය: ස්ත්‍රී 1 පුරුෂ 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.1 උපන් දිනය: වර්ෂය මාසය දිනය

3.2 ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස:————. අවු. මාස දින

04. විවාහක/අවිවාහක බව:————.
විවාහක - 01 අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. අධ්‍යාපන සුදුසුකම්:————.
(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ)/ජා.පො.අ.ස. විභාගය ෑ

| | පළමු වතාව | දෙවන වතාව |
|---|---|---|
| විභාගයේ නම: | ........................... | .............................. |
| වර්ෂය හා මාසය: | ........................... | .............................. |
| විභාග අංකය: | ........................... | .............................. |
| භාෂා මාධ්‍යය: | ........................... | .............................. |

පළමු වතාව | දෙවන වතාව

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1 | | | 1 | | |
| 2 | | | 2 | | |
| 3 | | | 3 | | |
| 4 | | | 4 | | |
| 5 | | | 5 | | |
| 6 | | | 6 | | |
| 7 | | | 7 | | |
| 8 | | | 8 | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය:

වර්ෂය හා මාසය: ..........................
විභාග අංකය: ..........................
භාෂා මාධ්‍යය: ..........................

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

(ඇ) වෘත්තීය සුදුසුකම් :

| ඩිප්ලෝමාව සහ ආයතනයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | සමත් විෂයන් | සාමාර්ථය |
|---|---|---|---|---|
| | | | | |

06. සේවය කිරීමට කැමති දිස්ත්‍රික්කය හා කොට්ඨාශය (කෘෂිකර්ම උපදේශක තනතුරට පමණි)

| | | සංකේත අංකය |
|---|---|---|
| 1 | .......................... | .......................... |
| 2 | .......................... | .......................... |
| 3 | .......................... | .......................... |
| 4 | .......................... | .......................... |
| 5 | .......................... | .......................... |

07. (අ)

| | |
|---|---|
| විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ අංකය | |
| දිනය | |
| මුදල් ගෙවූ තැපැල් කාර්යාලය | |

| විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙනසේ මෙහි අලවන්න |
|---|

(ආ) 2006.12.15 හා 2007.02.09 දිනැති ගැසට් පත්‍රයේ දැන්වීම අනුව අයදුම්පත්‍ර ඉදිරිපත් කළ අයදුම්කරුවන් පමණක් පහත සඳහන් විස්තර සඳහන් කරන්න ඃ

| කුවිතාන්සියේ අංකය | ගෙවූ දිනය | තැපැල් කාර්යාලය |
|---|---|---|
| | | |

08. *අයදුම්කරුගේ සහතිකය :*

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

මෙම විභාගයේ කොන්දේසි සියල්ල පිළිපැදීමට මම එකඟ වෙමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:———.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................. යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ........................දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

———————,
අත්සන සහතික කරන ලද නිලධාරියාගේ අත්සන.

දිනය:———.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:———.
තනතුර:———.
ලිපිනය:———.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

*විභාග කොමසාරිස් ජනරාල්,*

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂක/අපේක්ෂිකාවට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ඇති/නැති බව මම සහතික කරමි.

———————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
පදවි නාමය.

දිනය:———.

03-406

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.